# 2020

## හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

## පළමුවන කාර්තුව

දිනය : 2020.02.14

වේලාව : පෙ.ව. 09.30

ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් පැමිණ සිටි පිරිස පිළිගෙන කමිටුවේ අරමුණ පැහැදිලි කරන ලදී.

| විෂය | සාකච්ඡා වූ වාර ගණන | කාරණය | තීරණය/නිරීක්ෂණ | වගකීම |
|---|---|---|---|---|
| 1. සංවර්ධන වැඩ | 27 | අම්බලන්තොට කිරිමැටිආන උස්සාන ජල යෝජනා ක්‍රමයට අදාල විගණන විමසුමට පිළිතුරු ලබාගැනීම. මේ සම්බන්ධව ගිණුම් කාරක සභාවේදී, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉංජිනේරු මගින් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා ගන්නා ලෙස දන්වා ඇත. අමාත්‍යාංශය විසින් එය දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා ) වෙත පවරා ඇති අතර දකුණු පළාත් නිර්මාණ ඉංජිනේරු වෙත පරීක්ෂණයක් කර වාර්තා කරන ලෙස දන්වා ඇත. | දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා ) වෙතින් පරීක්ෂණ වාර්තාව ලැබී ඇත. | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 2. කුට්ටිගල් ඇතිරීම | 8 | කුට්ටිගල් ඇතිරීමේ මිල විශ්ලේෂණය තුළ කුට්ටිගලක ප්‍රමාණය ඇතුලත් නොකිරීම නිසා වරදක් ඇති අතර එම නිසා රජයේ මුදල් අපතේ යාමක් දක්නට ඇත. දකුණු පළාතේ දිස්ත්‍රික්ක 3 හි මිළ ගණන්වල විශාල පරතරයක් ඇත. මෙම ගැටළුවට අමාත්‍යාංශ මට්ටමින් විසඳුමක් ලබා ගැනීමට ..ස්වදේශ කටයුතු.. අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවා ඇත. | 1.අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණ) විසින් පර්යේෂණ කටයුතු ආරම්භ කර ඇතත් මේ වන තෙක් වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බැවින් 2020/03/31 ට පෙර වාර්තාව ගෙන්වා ගැනීමට සිහි කැඳවීම් ලිපියක් යැවීමට තීරණය කරන ලදී. | ප්‍රධාන අභ්‍යන්තර විගණක<br><br>ප්‍රාදේශිය ලේකම්වරු/ ගණකාධිකාරිවරු<br><br>ප්‍රධාන ගණකාධිකාරී |
| 03. කැට ගල් ඇල්ලීම | 7 | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මාර්ගවල කැටගල් ඇල්ලීමේදී ප්‍රමිතියෙන් තොර කැටගල් යොදා මාර්ග ඉදිකිරීම. නිසි අධීක්ෂණයකින් තොරව ගෙවීම. ව්‍යාජ තත්ත්ව සහතික ඉදිරිපත් කර තිබීම විමසන ලදී. ඒ අනුව වගකිව යුතු අයට එරෙහිව මූලික විමර්ෂණයක් කිරීම. | විමර්ෂණ නිලධාරින් ලබා දුන් වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කිරිමටත් මූල්‍ය අලාභය තක්සේරු කිරීම සම්බන්ධව කටයුතු කිරිමට කඩිනමින් කමිටුවක් පත්කිරිමත්,සති 02ක් තුළ චෝදනා කෙටුම්පත් අවසන් කළ යුතු බවත් දැනුම් දෙන ලදී . | විමර්ෂණ අංශ ප්‍රධානී |

| | | | | |
|---|---|---|---|---|
| 04. ලුණුගම්වෙ හෙර ජැටිය ඉදිකිරීම | 3 | ලුණුගම්වෙහෙර ධීවර ජැටිය ඉදිකිරීමේ දී සිදුවී ඇති ගැටළු සම්බන්ධ විගණන විමසුම අනුව පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාවේ අඩුපාඩු ඇත. | තවමත් ජලාශය 90%ක් පමණ ජලයෙන් පිරීපවතින බැවින් ජලය අඩුවූ වහාම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ සභාපතීත්වයෙන් පත් කළ කමිටුවක් විසින් නැවත පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලද අතර මිනුම් ලබා ගන්නා තුරු ජේදය ඉදිරියට ගෙන යාමට තීරණය විය. | ප්‍රධාන ගණකාධිකාරී<br><br>දිස්ත්‍රික් කෘෂි කර්ම අධ්‍යක්ෂක |
| 05.ලුණුගම් වෙහෙර ප්‍රා.ලේ.කා. අගුණුකො ළවැව ළමා මධ්‍යස්ථාන ය ඉදිකිරීම | 9 | ඉදිකිරීම අසල ඇති ග්‍රාම නිලධාරී කාර්යාලයේ ඉදිකිරීමට අදාල උපකරණ ගබඩා කරමින් එම කාර්යාලයේ ජලය හා විදුලිය භාවිතා කරමින් මෙම කර්මාන්තය, කාර්යාල නිළධාරියෙක් විසින් සමිතියක් නමින් කරන බවට වූ පැමිණිල්ල. විධිමත් විනය පරීක්ෂණයේ වර්තමාන තත්ත්වය විමසීම. | විධිමත්ව විනය පරීක්ෂණය සිදු කර ඇතත් පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාව මේ වන තෙක් ලැබී නොමැති බව දන්වා ඇත. නැවත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත සිහිකැදවීමක් කරන ලෙස දන්වන ලදි. | අතිරේක දි.ලේ |
| 06.ගිණුම් කාරක සභා තීරණ | 6 | 1.සූරියවැව,කොට්ඨාසයේ රියැදුරු බලපත්‍ර ලබා දීමේ කටයුතු අවසන්කර නොතිබීම. පුහුණුවීම් සඳහා අවස්ථාව ලැබූ 66න් 33 දෙනෙකු පුහුණුව ලබා ඇති අතර ඉන් 24 දෙනෙකු සමත්ව ඇත. අසමත් වූ 09 දෙනාද දැනට පුහුණුව ලබන අතර මීට අමතරව තවත් 33 දෙනකු පුහුණුව අපේක්ෂාවෙන් සිටිනු ඇත. | ඉතිරි වූ අය සඳහාද පුහුණුව ලබා දෙන බවට ගමනාගමන මණ්ඩලයෙන් අනුමැතිය සහිත ලිඛිත පිළිතුරක් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. | ප්‍රාදේශීය ලේකම් සූරියවැව |
| | 5 | 2.පරිපාලන සංකීර්ණයයට අයත් භූමියේ ඇති නිළ නිවාසවල කුලී අයකිරීම. මෙම නිවාස තවම නාගරික සංවර්ධන අධිකාරිය විසින් විධිමත්ව දිස්ත්‍රික් ලේකම් වෙත පවරා නැත. නාගරික සංවර්ධන අධිකාරියට ද ඉඩම පවරා ගෙන නැත. | ඉඩමේ අයිතිය අත්පත් කර ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් මහවැලි අධිකාරියෙන් ඉල්ලීම් කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |

| | | | | |
|---|---|---|---|---|
| 07.කළුගල් බලපත්‍ර | 4 | 1.රජයේ ඉඩම් වල කළුගල් කැඩීම සඳහා අවසර දීමේ දී වාර්ෂික බලපත්‍ර, දීර්ඝ කාලීන බදුකර ලබාදීම නීත්‍යානුකූල කිරීමට කටයුතු කර නොතිබීම.<br>2.ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රාජ්‍යභාගය අයකර ඇති අවස්ථා නිරීක්ෂණය වීම.<br>3.වර්ෂ 12 ක් තිස්සේ තාවකාලිකව අත්හිටුවා ඇති 1303/17 ගැසට් පත්‍රය වෙනුවට 94/833(2003-08-28) ගැසට් නිවේදනය මගින් වර්තමානයට ගැලපෙන පරිදි ගාස්තු 1600/18 වාර්ථාව මගින් හඳුන්වා තිබියදී ඊට ගැලපෙන ලෙස ගාස්තු අය නොකිරීම.<br>පතල් හා කැනීම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාවක් සංවිධානය කර මේ සම්බන්ධව සාකච්ඡා කිරීම. | 2019/12/10 ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට අනුව දැනට පවතින නීතිමය තත්ත්වය මත කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බාධාවක් නොමැති බව හම්බන්තොට විගණන අධිකාරිය මඟින් කරුණු දක්වන ලදී. වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් 2020/02/20 දින ප්‍රාදේශීය ලේකම් සාකච්ඡාවේදී සාකච්ඡා කිරීමට සූදානම් වන ලෙස අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් |
| 08.ග්‍රාම ශක්ති ව්‍යාපෘති | 4 | ග්‍රාම ශක්ති වැඩපිළිවෙලේ ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය ජනතාව සමාජීය හා ආර්ථික වශයෙන් බල ගැන්වීම ග්‍රාමීය දරිද්‍රතාව දුරැලීම, ඉතුරුම් ශක්තිමත් වීම වුවත් ඒ සඳහා ඍජු දායකත්වයක් ලැබෙන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා නොදීම. | ඉදිරියේදී රජය මඟින් ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දෙන තෙක් ජේදය තැබීමට තීරණය කරන ලදී. | අධ්‍යක්ෂ (සැලසුම්)<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| | 4 | කුඩා කණ්ඩායම් බිහිකර ග්‍රාමීය ඉතුරුම් ශක්තිමත් කර ණය සංවිධාන ස්ථාපිත කර ගැනීමේ අරමුණ සඳහා අවධානය යොමු නොකිරීම | | |
| 09.වැඩ අවසන් නොකල ව්‍යාපෘති | 4 | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රැකව කලපුව සීමා මායිම් ලකුණු කර සිතියම් ගත කිරීම වෙනුවෙන් රු.1625511.00 ක මුදලක් 2017.12.30 දින හම්බන්තොට ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී වෙත ගෙවීම් කර තිබුනද තවමත් එය අවසන් නොවී තිබීම. | කොන්ක්‍රීට් කණු 1004 න් දැනට කණු 524 ක් සිටුවා ඇති අතර තවත් 11km ක මැණුම් කටයුතු සිදු කිරීමට ඇත. ගැටළු සහගත ස්ථාන දෙකක් ඇති අතර සිවිල් ආරක්ෂක අංශය මඟින් කණු සිටුවීම නතර කරන ලදී. ඉදිරියේදී ගැටළු නිරාකරණය කරමින් මැනුම් කටයුතු කටයුතු කර දෙන ලෙස මිනින්දෝරු අධිකාරියට සහ සිවිල් ආරක්ෂක අංශයට ලිඛිතව දන්වා යවන ලෙස දැනුම් දෙන | තංගල්ල ප්‍රාදේශීය ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලදී. | |
| 10.රජයේ ඉඩම් අනවසරයෙන් පරිහරණය | 4 | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීනිමෝදර නැගෙනහිර ග්‍රාම නිළධාරී වසමේ "කළුගල් ආර ,ලැබීම, ලොට් 01" ඉඩමේ කළුගල් කැඩීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී යාබද රජයට අයත් ඉඩමද අනවසරයෙන් පරිහරණය කිරීම. | භූ විද්‍යා හා පතල් කාර්යංශය සම්බන්ධ කරගනිමින් අවසර ලබාදී ඇති සීමාව හඳුනාගෙන ඇති අතර, ඒ අනුව රජයේ ඉඩමෙන් කළුගල්කැඩීම සිදුවී නොමැති බව තහවුරු කර ගන්නා ලදී.ඒ පිළිබඳ වාර්තාව තවම ලැබී නොමැති බව දන්වන ලදී. | තංගල්ල ප්‍රාදේශීය ලේකම් |
| | 4 | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාර්මික කැණීම් බලපත්‍ර 03ක් ලබා දී ඇති අතර එම ඉඩම් වල GPS ඛණ්ඩාංක ඉක්මවා කැණීම් කර තිබීම. එහි එක් ඉඩමකට ලබා දී ඇත්තේ අක්කර 1.5ක් වන අතර එය අක්කර 4.7 ක් දක්වා පුළුල් කර තිබීම. | නඩුව මඟින් රාජ්‍ය භාගය ලෙස රු. ලක්ෂ 22 ක ප්‍රමාණයක් අයකර ඇත. රජයේ ඉඩම සම්බන්ධයෙන් කළ යුතු පරීක්ෂණය ඉතා සංකීර්ණ බැවින් වාර්තාව ඉදිරිපත් කිරීමට මසකට කල් ලබාදෙන බවට ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉල්ලීම් කරන ලදී. | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම්<br><br>ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 11 (1) අභ්‍යන්තර විගණන විමසුම් | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | |
| | 01 | 01. නිල සෙවන ව්‍යාපෘති සඳහා ජලය, විදුලිය, උපකරණ ලබාදීම යටතේ සිදුවී ඇති අඩුපාඩු; කොඩිකණු වෙනුවට ජී.අයි බටයක් පමණක් සැපයීම හා සුදුසු සැපයුම්කරුවකුගෙන් සැපයුම් ලබා නොගැනීම (රුහුණු ඉලෙක්ට්‍රිකල් ආයතනය ලියා පදිංචි වී ඇත්තේ විදුලි උපකරණ සැපයීම වෙනුවෙනි), ප්‍රථමාධාර පෙට්ටි උපදෙස් පරිදි නොසැපයීම හා එහි ප්‍රථමාධාරක නොමැතිවීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ ගණකාධිකාරී |
| | 01 | 02. සිංහපුර ග්‍රාම නිලධාරී වසමේ සුරනිමල විද්‍යාලයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම; සන්නාම නාමයකින් තොර උපකරණ භාවිතා කිරීම හා එය නිසි පරිදි සවි නොකිරීම, අනාරක්ෂිත වැසිකිළි වලක් වෙත අපවහන නල යොමු කිරීම හා නිසි පරිදි වැසිකිළි දොර සවි නොකිරීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ තාක්ෂණික නිලධාරී |

| | | | | |
|---|---|---|---|---|
| | 01 | 03. වීරවිල් ආර ග්‍රාම නිලධාරී වසමේ නිලසෙවන සේවා පියස ඉදිකිරීම; පතුල් පටිය ඉදිකිරීම වෙනුවෙන් ගෙවීම් කර ඇතත් එය ඉදි නොකිරීම, (විදුලි) භූගත පයිපය වෙනුවට භූගත කුරක් භාවිතා කර ගෙවීම් කිරීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ තාක්ෂණික නිලධාරී |
| | 01 | 04. පුංචිඅප්පුජදුර සේවා පියස ඉදිකිරීම; නිලසෙවනේ නිලධාරීන්ගේ කාර්යාල වෙන් කිරීමට භාවිතා කර ඇත්තේ ඇස්තමේන්තුවේ සඳහන් වර්ගයේ උපකරණ නොවන අතර සාමාන්‍ය බොක්ස් බාර්ය. එහෙත් ඇස්තමේන්තු ප්‍රකාරව රු.583021.00 මුදලක් ගෙවීම් කර තිබීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ ගණකාධිකාරී |
| | 01 | 05. රඹුක්වැව කු.ග 10 කාවන්තිස්ස මාවත හා කීර්තිපුර විහාරමහාදේවීපුර මාවත කැටගල් ඇතිරීම යටතේ සිදු කරන ලද ව්‍යාපෘතිවල ගෙවීම් කර ඇති ප්‍රමාණයට වඩා අඩුවෙන් ව්‍යාපෘතිය සිදු කිරීම, මාර්ග අයින සඳහා මි.මී 10 කම්බි යොදා නොගැනීම, ඉදිකිරීම් නිමාවේ දෝෂ පැවතීම යන කරුණු මත රජයට රු 225807.79 පාඩුවක් සිදු කිරීම | මුදල් ගෙවීමක් සිදු කර ඇති බවත්, විමර්ශනයක් ආරම්භකර ඇති බවත් දන්වා ඇත. | ප්‍රා.ලේ/ විමර්ශන නිලධාරී |
| 11(II) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | |
| | 01 | 01. මෝලකැපුපතාන ගොඩාන මැද මාවත කැටගල් ඇතිරීම; මාර්ග අයින නියමිත ප්‍රමිතියෙන් යුතු කොන්ක්‍රීට් භාවිතා නොකිරීම මත දැනටමත් විනාශ වෙමින් පැවතීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ ගණකාධිකාරී |
| | 01 | 02. වැලිආර ගොඩ මාර්ගයේ අබලන් බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම; මේ යටතේ ඉදිකර ඇති බෝක්කුවේ එක් පැති බැම්මක් මේ වන විටත් පුපුරා ගොස් තිබීම (රුඳවුම් ද නිදහස් කර ඇත) | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ තාක්ෂණික නිලධාරී |
| | 01 | 03. ජුල්පල්ලම ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය සභා පෙරපාසල් ගොඩ නැගිල්ල වටා ආවරණ වැට ඉදිකර ගේට්ටුවක් සවි කිරීම; සවි කරන ලද ගේට්ටුව කණුවට සම්බන්ධ කරන කොටස කැඩී ගොස් ඇත. වැට තුන්පැත්තක පමණක් සකස් කර තිබීමෙන් අරමුණ ඉටු නොවීම. මෙම පෙර පාසල් ගොඩනැගිල්ල 2014 වර්ෂයේ ඉදිකර ඇති අතර වැඩ අවසන් කර නැත. එම ගොඩනැගිල්ල විනාශ වෙමින් පවතී | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ තාක්ෂණික නිලධාරී |
| | 01 | 04 ජම්බුගස්වැව වැව්කණ්ඩිය ඉදිකිරීම; 2017 වර්ෂයේද මෙය ප්‍රතිසංස්කරණ කර තිබූ අතර එහි ප්‍රමිතියෙන් තොර බොරළුපස් සපයා තිබීම, නියමිත ප්‍රමාණයෙන් අතුරා නොතිබීම හා සුසංහනය නොකිරීම සම්බන්ධයෙන් විමසුමකට ලක් කර තිබුණි. එහෙත් නැවතත් එම කොටසද ආවරණය වන පරිදි 2018 වර්ෂයේ ප්‍රතිසංස්කරණය කර තිබීම හා ඉහත පාඩුව අයකර නොගැනීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ තාක්ෂණික නිලධාරී |

| | | | | |
|---|---|---|---|---|
| | 01 | 05. කැටගල් ප්‍රවාහනය සඳහා අමතර ගාස්තුවක් වශයෙන් රු.3000.00ක මුදලක් සෑම බිල්පතකටම ඇතුළත් කර ගෙවීම, එම මුදල් ඇස්තමේන්තු නොකිරීම මගින් 2017-2018 වර්ෂවල පමණක් රු 231000.00 මුදල් අමතරව කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීම | | ප්‍රා.ලේ/ සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)/ ගණකාධිකාරී/ තාක්ෂණික නිලධාරී |
| 12 | වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලද කරුණු | | | |
| 04 රථවාහන අලාභ හා අනෙකුත් හානි | ආයතන අංශය මගින් ඉටු නොවූ වාහන අනතුරු ගොනු 43 ක කටයුතු ගිණුම් අංශය විසින් අවසන් කර ඇත. තවත් ගොනු 02ක කටයුතු සඳහා විස්තර නොමැත. විස්තර නොමැති ගොනු 2 පිළිබඳ වාර්තාවක් සකස් කර ඇති බවත් ඉදිරිපත් කිරීමට හැකි බව දන්වන ලදි. | වාහන සම්බන්ධයෙන් ගෙවීම් කටයුතු සිදුකර නොමැති බවටත්,රජයට අලාභයක් සිදු නොවී ඇති බවටත් වාර්තාවක් 2019.11.29 දිනට පෙර ලබා දෙන ලෙස දන්වන ලදි.<br>වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. | | |
| 05 ලුණුගමෙව හෙර විගණන විමසුම් | කැන්දගස්මංකඩ කු.ග. 02 දකුණ ඉවුර ප්‍රධාන ඇල කණ්ඩියේ සිට දකුණු දෙසට පළමු මාර්ගය, මෙහි ඉදිකිරීම් ඉතා දුර්වල මට්ටමේ තිබීම. මෙහි තත්ත්ව පරීක්ෂාවක් සිදුකල අතර, නැවත නිවැරදිකල කොටස්වල සාම්පල් පරීක්ෂාව 2019-05-16 දින සිදු කරන ලදි. | සාම්පල් පරීක්ෂණ වාර්තාව රජයේ විගණනයට ලබා දී ඇත.<br>වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. | | |
| 06.ටැබ් පරිගණක මිළදී ගැනීම | පරිගණක ටැබ් මිළදී ගැනීමේ දී එකම ආයතනය සති 02ක් තුල විවිධ මිළගණන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර තිබීම. එම නිසා මිළ ගණන් දෙකකට ටැබ් මිළ දී ගෙන තිබිම නිසා රුපියල් 50000/-ක අලාභයක් රජයට සිදුවීම. අලාභය ගෙවන ලෙස ආයතනයට දන්වා ඇත. | සැපයුම්කරු සඳහා දිසාපතිතුමාගේ අත්සනින් යුත් අවවාදාත්මක ලිපියක් නිකුත් කරන ලෙස දන්වන ලදි.<br>වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. | | |
| 10.වාහන සම්බන්ධ වාර්තා | අම්බලන්තොට ප්‍රා.ලේ.කාර්යාලයේ PA 3849 කැබ් රථයේ 2015-01-01 දින අනතුර සම්බන්ධව මුරේ 104/4 වාර්තා අනුව කටයුතු කර නොතිබීම<br>එම වාහනයේම 2016-01-16 අනතුර සම්බන්ධව 104/4 වාර්ථාව මේ දක්වා සම්පූර්ණ කර නොතිබීම. | රජයට සිදුව ඇති අලාභය අය කර ගැනීමට අනුමැතිය ලබා දී ඇති බවත් ඒ අනුව එම අලාභය දෙදෙනාගෙන් ම සමව අය කිරීමට කටයුතු කර ඇත.<br>වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කර ඇත. | | |
| 12.චක්‍රලේඛ | ඇපතැන්පත් කිරීමේ චක්‍රලේඛය අනුව අදාල නිළධාරීන්ගෙන් හා ඇප තැබිය යුතු නිළධාරීන්ගෙන් ඇප ලබා ගැනීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇප තැන්පත් කරන | | |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරීන් හා ඒ ඒ නිලධාරීන් ඇප තැබිය යුතු ප්‍රමාණයන් පිළිබඳව වාර්තාවක් ලබා දී ඇතිබවත්, මින් ඉදිරියටත් මේ අනුව කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී.<br>වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. | |
| 13 | ස්වදේශ කටයුතු... අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමාගේ අදහස් දැක්වීම(පැමිණ නැත) | | |
| 14 | කළමනාකරණ හා විගණන අධ්‍යක්ෂ තුමියගේ අදහස් දැක්වීම | | |
| | විගණන කළමනාකරණ කමිටු රැස්වීම නිසියාකාර ප්‍රයෝජනයක් ඇතිවඉදිරියට යන කමිටුවක් බවත්, | | |
| | බාහිර / අභ්‍යන්තර විගණන අංශ මඟින් ඉදිරිපත් කළ නිරීක්ෂණ ඉතා වැදගත් බවත් ඒ පිළිබඳව අවධානය යොමු කරමින් අඩුපාඩු මගහරවා ගැනීමට අවධානය යොමු කරන ලෙස දැන්වීය. | | |
| | භාණ්ඩ සමීක්ෂණයකදී ක්‍රියාකාරී මට්ටමේ පවතින භාණ්ඩ වුවද ඒවා භාවිතා කිරීමෙන් රජයට වැඩි පිරිවැයක් වන්නේ නම් විකිනීමට නිර්දේශ කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට හැකියාව පවතින බව පවසන ලදී. | | |
| 15 | දකුණු පළාත් ප්‍රධාන අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකතුමාගේ අදහස් දැක්වීම (පැමිණ නැත) | | |
| 16 | සහකාර විගණකාධිපතිතුමියගේ අදහස් දැක්වීම | | |
| | වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොමැති බව පෙන්වා දෙන ලදී. | | |
| | අභ්‍යන්තර විගණන විමසුමට අනුව කිහිප වතාවක්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගැටළු සාකච්ඡා වූ බවත් , එම ගැටළු අවම කර ගැනිමේ ක්‍රම වේදයක් අවශ්‍ය බවත්, ඒ සම්බන්ධයෙන් වැඩි වගකීමක් දිස්ත්‍රික් ඉංජිනේරු වෙත පැවරී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. | | |
| 17 | විගණන අධිකාරීතුමාගේ අදහස් දැක්වීම | | |
| | විගණන හා කළමනාකරණ කමිටුව ඉතා සාර්ථක බවත්, | | |
| | දිවිනැගුම විවිධ ණය යෝජනා වල හිඟ මුදල් බොල් ණය ලෙස සටහන් කර ඇති බව | | |
| | 2013/2014 විගණකාධිපති වාර්තාව අනුව සාකච්ඡා කිරීමට දිනයක් යොදා ගතයුතු බව | | |
| | අභ්‍යන්තර විගණන විමසුම් වල හොඳ ඡේද තිබූ බවත් , එම කරුණු දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීමට දිස්ත්‍රික් විගණන කමිටුවේ වාර්තාවට ඇතුලත් කිරීමට යෝජනා කරන ලදී. | | |
| | විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වන අලුත් කරුණු වාර්තාවේ මුලට ගැනීමටත් කලින් සාකච්ඡා කල කරුණු දෙවනුව සාකච්ඡා කිරීමටත් යෝජනා කරන ලදී. | | |
| | ලුණුගම්වෙහෙර බස් නැවතුම්පොලේ අල්ලා ඇති කැටගල්වල ගැටළු පවතින බැවින් නැවත පරීක්ෂා කළ යුතු බවත් | | |

| | | |
|---|---|---|
| | වලස්මුල්ල බස් නැවතුම්පොලේ කොන්ක්‍රීට් සම්පිණ්ඩතා ශක්තියේ දුර්වලතා පවතින බව | |
| | හුංගම ගොවිපලෙන් රජයට කිසිදු ආදායමක් නොලැබෙන බවත්, එය වර්තමානයේදීවත් නිවැරදි විය යුතු බවත් දන්වන ලදී. | |
| | බුන්දල අනවසර ඉදිකිරීම් යටතේ සුඛෝපභෝගී හොටෙල් 64 ක් ඉදිකර ඇති බවත්, එමඟින් රජයට කිසිදු ආදායමක් නොලැබෙන බවත්, ඒවා නීත්‍යානුකූල කර ගත යුතු බව පවසන ලදී. | |
| **18** | දිස්ත්‍රික් ලේකම්තුමාගේ අදහස් දැක්වීම | |
| | විගණන හා කළමනාකරණ කමිටුව ඉතා සාර්ථක පැවැත්වූ බවත්, | |
| | සේවා ලබා ගැනීම සඳහා කාර්යායකට පැමිණෙන මහජනතාවට අවශ්‍ය කටයුතු ඉතා ඉක්මණින් ඉටුකර දීමට කටයුතු කරන ලෙසත්, චක්‍ර ලේඛ/ නීතිමය උපදෙස් වලට අනුකූලව කටයුතු කිරීමට හැකිදේ පිළිබඳව සේවාලාභීන්ට කරුණු පැහැදිළි කළ යුතු බවත් පවසන ලදී. | |
| | බාහිර/ අභ්‍යන්තර විගණනය මඟින් කරන මග පෙන්වීම ඉතා ඵලදායී බවත් පවසන ලදී. | |

දිස්ත්‍රික් ලේකම්තුමාගේ ස්තුති කථාවෙන් පසුව කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

සී.ඒ. සුනෙත් ලෝචන
අතිරේක දිස්ත්‍රික් ලේකම්
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

සී. ඒ. සුනෙත් ලෝචන
අතිරේක දිස්ත්‍රික් ලේකම්
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙනුවට